ôÚx_´{ÚÍÆÈ Ã`ÌÍóÚ
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2015

# සිංහල සාහිත්‍යය හා රසාස්වාදය

**11 ශ්‍රේණිය** **කාලය පැය 3 යි.**

නම/ විභාග අංකයඃ

- I කොටසෙහි 01, 02 ප්‍රශ්න දෙකටත්, II කොටසෙහි 03 වෙනි ප්‍රශ්නයටත්, III කොටසෙන් තවත් ප්‍රශ්න දෙකකටත් වන සේ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## I - කොටස

01 අංක (i) - (v) තෙක් ඇති කොටස් කියවා ඒ එක එකක් පිළිබඳව අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) තොලු ගානා තණක්
දිය තලු තෙමන පමණක්
නැති ව තුරු සෙවණක්
දුකෙකි සිවුපාවුන්ට දියුණක්

(අ) ඉහත කවියෙහි විස්තර වන්නේ කිනම් අවස්ථාවක් ගැනද?

(ආ) ඉහත කවියට අනුව සිවුපාවුන්ට මුහුණ දීමට සිදු වූ දුක් ගැහැටවලින් එකක් ලියන්න.

(ii) ''සබඳ තෝ පිට නමනමා එන්නෙහි කිමෙක් ද? තා පිට රුජාවක් පහරී ද?''

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මෙම ප්‍රකාශය සඳහන් අතුරු කතාවෙහි නම කුමක් ද?

(iii) ''ඒකිටත් දූන් දරුවො දෙන්නෙක්නෙ. මං දැක්කා ඊයෙ එවුන් මඩ හොරොව්ව ළඟ බැහැලා නානව.''

(අ) මෙහි ඒකි කියා කියුවේ කාට ද?

(ආ) මෙසේ ප්‍රකාශ කළේ කවුරු ද?

(iv) සූරිය කුල ඇති ඉරු දෙවියන්නේ
පෑවිය අණසක ලොව පවතින්නේ
කාරිය සිතුවා සාදා දෙන්නේ
සූරිය දෙවියනි නුවණක් දෙන්නේ

(අ) මේ කවිය ඇතුළත් වන කෘතිය කුමක් ද?

(ආ) මෙසේ ආයාචනා කරන්නේ කුමකට ද?

(v) උණුසුම සිසිල සහ අතරෙහි ඇති ගුණය
ඇති අන් රටක් නැත මගෙ රට ඇති තැනය
මුව මී ගෝන ඇත් සේනා ඇති වනය
පවසන්නේ ය මට ඇති ජාතික ධනය

(අ) ඉහත කවිය ඇතුළත් කවි පංතිය රචනා කළ කවියාගේ නම ලියන්න.

(ආ) අප රටේ ජාතික ධනය ලෙස මේ කවියෙහි දැක්වෙන කරුණු අතුරෙන් එක් කරුණක් තෝරා ලියන්න. (ල . 20)

02 පහත සඳහන් ගද්‍ය හා පද්‍ය කොටස්වල **තද කළු අකුරින් මුද්‍රිත** පදවල අර්ථය පළමුව වෙන් වෙන්ව ලියා එක් එක් පාඨයෙහි සමස්ත අර්ථය ද ලියන්න.

(i) පණ්ඩිතයන් වහන්සේ ද දෙව්ලොව දෙවියන් පිරිවරා අසුර යුද්ධයට නික්මුණු සක්දෙව් රජහු පරිද්දෙන් **උපමා විෂයාතික්‍රාන්ත** වූ ශ්‍රී **සෞභාග්‍යයෙන්** යුක්ත වැ ඒ අෂ්ටවංක මාණික්‍ය රත්නය අතින් ගෙන, කේවට්ටයන් ඉදිරියෙහි ළංව වැඩිසේක.

(ii) විහිදා **දසත සරසන** මිණි කිරණ රැසේ
දළඳා මැඳුර රන්කොත් සමග නුබ කුසේ
මහ දා ගැබ් සිරස දිලිකොත් කැරලි රැසේ

**පැහැදා පෙනේ** තවමත් මට උතුරු දෙසේ

(iii) අම්මොයි කියා ගෑ **සියොළඟ** තෙල් රුවට
යම්මොයි කියා යති අකුරට ගුරුන් ගෙට
බම්මොයි කියා බස් **තෙපලති** විටින් විට
අම්මොයි කියා කීවත් ගුරු දෙතෙයි බැට

(iv) යම්තම් හිත තැවරුණු **සැදෑහක්** නැත
නමුත් නොදත් ආගම දහමක් නැත
තුන්ලොව නොපෙනෙන කිසිම දෙයක් නැත
**කීම මිසක** කළ කිසිම දෙයක් නැත

(v) කිසි කෙනෙකුත් මහ වාසලින් තබා **කුරුබිලියෙනුත්** පිටත්විය නොදෙම්හ. එකල මනුෂ්‍යයෝ උකටලීව තුමූ ම දොර ඇර පියන්නාහ. එවිට අපි **අනායාසයෙන්** සතුරන් අල්ලාගෙන කැමැත්තක් කරම්හ. (ල. 25)

## II - කොටස

● **පහත සඳහන් කවිපෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

03 සිව්යෙන් මිදුණු බෝවිටියා ගෙඩිය සොයා
මල් කැකුළකට නැකම් ඇති තුඩග තියා
ලස්සන කිරිල්ලක් වන ළැහැබකට ගියා
දිටියෙමි ඇගේ කුඩුව කොතැනකද කියා

නොපෙනෙන පරිදි මිනිහකුගේ පියවි ඇස
ළැහැබෙහි කුඩා පඳුරක අතු රිකිලි හිස
ඇය බැඳි කැදැල්ලෙහි සැඟවුණු මිහිරි රස
වැටහෙයි මටත් ගත හැකි නම් කුරුලු වෙස

මල් කොළවල ම පාටින් ඉවතට නොයන
දිය පෙඳ පාසි බිතුරස අඳුනකි නයන
මායා සිහිනයක හැඩහුරුකම් කියන
පිනිබර කැකුළු මල් පොකුරකි දොර පියන

(1) මේ කවියේ අරමුණ කුමක් ද? (ල. 05)

(2) මේ කවි පෙළින් ප්‍රකාශවන ප්‍රධාන කරුණු මොනවා ද? (ල. 05)

(3) මෙහි බස් වහර ගැන කිව හැකි අදහස් දක්වන්න. (ල. 05)

(4) මේ පද්‍ය රචනය මගින් ස්වාභාවික පරිසරයේ ඇති චමත්කාරය ඉස්මතු කිරීමට දැරූ තැත ගැන ඇගයීමක් කරන්න. (ල. 10)

**<u>නැතහොත්</u>**

පහත සඳහන් කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

''කට පියා ගනිල්ලා, ඔය ගම්මැදි හැලි වලින් අපට වැඩක් නැහැ. අපි තිලකරත්න මහත්තයට කියල පෙත්සමක් ලියල ඒජන්ත උන්නාන්සෙට අරිමු'යි කෙනෙක් කී ය. පෙත්සම අරින්නේ කොහොම ද ඒ දණ්ඩෙ කැලිත් නැතිව'' මිනිස්සු මා වෙත රැස් වූ හ.''

අනුරපුරේ ගරු දිසාපතින් දා පෙත්සම් විසි ගණනක් මම ලිව්වා
දෙපතුළ අල්ලා උතුමට වැන් දා රුපියල බැගිනුත් ඒවට ගෙව්වා
ගංවතුරක් විත් මොකටද මන් දා ඇමති තුමාටත් කොපියක් යැව්වා
සුංවිය අහෝ රජ රටෙහි දිළින් දා තමුන්නාන්සෙට එව්වයි කිව්වා

(1) මෙහි සඳහන් ලියැවිල්ල කවුරුන් කා හට ලියනු ලබන්නක් ද? (ල. 05)

(2) මෙයින් පිඩුකොට දක්වන්නේ කවරක් ද? (ල. 05)

(3) මෙමගින් කතුවරයාගේ කවර ලක්ෂණයක් අනාවරණය වේ ද? (ල. 05)

(4) මේ කතාව විකාශනය කළ අයුරු ගැන ඇගයීමක් කරන්න. (ල. 10)